# ධීවර කර්මාන්තය, සංවර්ධනය සහ සන්නිවේදනය

## (නාරා ආයාතනයට විශේෂිතව කරනු ලබන ක්ෂේත්‍ර අධ්‍යයනයක්)

ආර්.ඒ. නෙලංග ජයසිංහ[1]

දශක තුනක යුද ගිනි දැල් නිවී සාමය ස්ථාපිත වූ අපේ මව්බිම වන ශ්‍රී ලංකාව වර්තමානය වන විට සෑම ක්ෂේත්‍රයක් තුළම සංවර්ධන විප්ලවයක් සිදු කරමින් සිටින බව හඳුනාගත හැකිය. මෙහිදී රටේ ආර්ථික සංවර්ධනය හා ග්‍රාමීය සංවර්ධනය අතිශයින් වැදගත් වන කරුණු ලෙස පෙන්වා දිය හැකිය. ධීවර කර්මාන්තය ශ්‍රී ලංකාවේ පැරණිම සමාජ ක්‍රම හා බැඳුණු එකක් බව ඓතිහාසික තොරතුරුවලින් පවා තහවුරු කරගත හැකිය. මෙම ධීවර කර්මාන්තය ශ්‍රී ලංකාව තුළ ප්‍රධාන වශයෙන් කරදිය ධීවර කර්මාන්තය මිරිදිය ධීවර කර්මාන්තය ලෙස කොටස් දෙකකින් යුක්ත බව පෙනී යයි. ශ්‍රී ලංකාව තුළ ධීවර කර්මාන්තයේ සංවර්ධනයට දායකත්වය සපයන ආයතන ගණනාවක් හඳුනා ගත හැකිය. එම ආයතන අතර ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය ලෙස හැඳින්වෙන නාරා ආයතනය ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තය උදෙසා අමිල සේවයක් ඉටු කරමින් සිටින බව හඳුනාගත හැකිය. ධීවර කර්මාන්තයේ සංවර්ධනය උදෙසා නාරා ආයතනය සන්නිවේදන විධික්‍රම භාවිත කරන ආකාරය හඳුනා ගැනීම මෙම පර්යේෂණයේ **ප්‍රධාන අරමුණ වේ**. ධීවර කර්මාන්තයේ සංවර්ධනය උදෙසා නාරා ආයතනය සන්නිවේදනය භාවිත කරන්නේ කෙසේද? යන්න සොයා බැලීම මෙම **පර්යේෂණයේ ගැටලුව** ලෙස පෙන්වා දිය හැකිය. මෙම පර්යේෂණය සිදු කිරීම සඳහා **පර්යේෂණ ක්‍රමවේද කිහිපයක්** භාවිත කරන ලදී. විශේෂයෙන්ම නාරා ආයතනය ධීවර ජනතාව වෙත තොරතුරු සන්නිවේදනය කිරීම සඳහා නව තාක්ෂණික ශිල්පීය ක්‍රම භාවිතය පිළිබඳව සාගර විද්‍යා අංශයේ මත්ස්‍ය බිම් පුරෝකථන ඒකකයේ අංශ ප්‍රධාන සමඟ සම්මුඛ සාකච්ඡා ක්‍රමය මඟින් තොරතුරු ලබා ගැනීම සිදු කරන ලදී. එසේම නාරා ආයතනය විසින් මුද්‍රණය කර පළ කරනු ලැබූ කරුණු අන්තර්ගත විශ්ලේෂණයට ලක් කර ධීවර කර්මාන්තය සංවර්ධනයට එහි ඇති දායකත්වය පිළිබඳව විශ්ලේෂණය කිරීම මෙහි අනෙක් පර්යේෂණ ක්‍රමවේදය ලෙස හඳුනාගත හැකිය. මෙම **පර්යේෂණයේ උපකල්පනය** ලෙස ධීවර කර්මාන්තයේ සංවර්ධනය උදෙසා නාරා ආයතනය නව ප්‍රවණතා සහිත විවිධ සන්නිවේදන විධික්‍රම භාවිත කරයි ලෙස උපකල්පනය කෙරුණි. ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය ලෙස රටේ සංවර්ධන කර්තව්‍යයට නොමඳ දායකත්වයක් සපයන බව ඉහත **නිගමනය** කර ගැනීමට හැකි විය.

ප්‍රමුඛ පදඃ නාරා ආයතනය, තාක්ෂණික ශිල්පීය ක්‍රම, සන්නිවේදන විධික්‍රම, ධීවර කර්මාන්තය

---

[1]සහකාර කථිකාචාර්ය, ජනසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය